**ශීර්ෂය 186 - තාක්ෂණ අමාත්‍යාංශය**

**-----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 186 - තාක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තාක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ඔක්තෝබර් 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අමාත්‍යාංශය යටතේ පැවති ආයතනයක් වන ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගමේ (SLINTEC) ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් ඉකුත් වර්ෂ වල වැය කර තිබු රු.700,000,000 ක් අමාත්‍යාංශයේ වත්කම ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එකතුව රු.713,569,740 වන දේපල පිරියත හා උපකරණ වටිනාකම තුල දක්වා තිබුණි. | රු.700,000,000ක වියදම තාක්ෂණ අමාත්‍යාංශයේ පරිගණකගත ගිණුම් පද්ධතියෙන් අපහරණය කර අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිගණකගත ගිණුම් පද්ධතිය ඔස්සේ පවරා ගැනීමට කටයුතු කිරීමට එකඟතාවය දන්වා එවන ලෙස දැනුවත් කල අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ New Cigas Web Interface තුල වත්කම් ගිණුම්ගත කිරීමට අවශ්‍ය ප්‍රවේශයන් නොමැති බවත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අදාල ප්‍රවේශය සකසා දුන් විගස වටිනාකම ගිණුම් ගත කර අප දැනුවත් කිරීමට කටයුතු කරන බව අප වෙත දැනුම් දී ඇත. | අමාත්‍යාංශය සතු වත්කම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.5,190,000 කට මිලට ගෙන තිබු ලැප්ටොප් පරිගණක යන්ත්‍ර විස්සක (20) වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ යටතේ ඇතුලත් කර නොතිබුණි. | එම වටිනාකම 2023 මාර්තු මාසයේදී CIGAS වැඩසටහනට අමාත්‍යාංශයේ වත්කම් ලෙස ඇතුලත් කිරීමට කටයුතු සිදුකර තිබේ | මිලදී ගන්නා වත්කම් අදාල කාලපරිච්ඡේදය තුලදීම වත්කම් ලෙස ගිණුම්ගත කල යුතුය |

(ආ) **අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වන් ගෝල්ෆේස් කුළුණෙහි එකොළොස්වන මහලේ අමාත්‍යාංශය පවත්වාගෙන යාම වෙනුවෙන් ඇතිකරගත් බදුකුලී ගිවිසුමට අනුව මූලික තැන්පතු මුදල ලෙස රු.4,206,720ක් ගෙවා තිබුණි. 2016 අගෝස්තු මස 03 වන දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 250/2016(i) අනුව රජයේ කාර්යාල ගොඩනැගිලි කුලී සඳහා අත්තිකාරම් ගෙවීම ජනරජ ගිණුමේ හෙළිදරව් කිරීමේ අරමුණින් එක් එක් අත්තිකාරම් වෙනුවෙන් 9188 - කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම සහ 9189 - කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම යන ප්‍රධාන ලෙජර් ගිණුම් යටතේ සටහන් කර නොතිබුණි. | ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි මෙම තැන්පතු මුදල ආපසු ලබාගන්නා දිනයේදී අවශ්‍ය කටයුතු කිරීමට හා නිසිපරිදි ගිණුම්ගත කිරීමට හැකිවන පරිදි කුලී වැඩ හා අත්තිකාරම් සංචිත ගිණුම යටතේ ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 250/2016 (I) අනුව සිදුකිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවති. | කුලි සඳහා ගෙවන ලද අත්තිකාරම් කුලි හා වැඩ ගිණුම තුල නිසි පරිදි සටහන් කල යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වියදම් කළමනාකරණයේ අඩුපාඩු නිසා වැය විෂයන් හතක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.2,150,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබූ අතර, තවත් වැය විෂයයන් දෙකක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.1,400,000 ක් වූ ප්‍රතිපාදන වලින් රු.950,000 ක් වෙනත් වැය විෂයයන් වලට මාරුකිරීමෙන් අනතුරුව ප්‍රතිපාදනය රු.450,000 ක් ඉතිරිකර තිබුණි. | තාක්ෂණ අමාත්‍යාංශය ගරු ජනාධිපතිතුමා යටතේ ක්‍රියාත්මක වන බැවින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා අමාත්‍ය කාර්යාලයක් හෝ රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයක් නොමැති විය. 2022.09.08 වන දින සිට තාක්ෂණ රාජ්‍ය අමාත්‍යවරයා පත් වූ අතර අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වර්ෂයේ අග භාගයේ දී සිදු වූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වීම් සිදු වී තිබේ. මේ සඳහා පොදු වශයෙන් ඉහත කාරණා හේතු වූ අතර ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 යටතේ | ඇස්තමේන්තු නිවැරදිව සකස් කර අවශ්‍ය ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන වෙන්කරගෙන නිසි පරිදි වියදම් කළමනාකරණය කල යුතුය. |

| | | |
|---|---|---|
| | අත්‍යවශ්‍ය වියදම් පමණක් දැරීම මගින් වියදම් පාලනය කිරීම, අමාත්‍යාංශය සඳහා කිසිදු වාහනයක් වර්ෂය තුල වෙන් නොවීම නිසාත්, අමාත්‍යාංශය වන් ගෝල්ෆේස් ගොඩනැගිලිලේ පවත්වා ගෙන යාම නිසාත් අළුත්වැඩියා අවශ්‍යතා පැන නොනැගීම වැනි කරුණු නිසා එක් එක් වැය ශීර්ෂයන් වල ඉතිරිවීම් සිදු වී තිබේ | |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.183,248 ක් වූ බැදීම් හා බැරකම් හඳුනාගෙන 2022 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන තුල ඇතුලත්කර නොතිබුණද, 2023 පළමු කාර්තුවේදී මෙම බැදීම් හා බැරකම් වලට ගෙවීම් කර තිබුණි. | 2023 වර්ෂයේදී ඇතිවන බැරකම් සඳහා ලේඛනයක් නඩත්තු කර නිසි පරිදි අවසන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් කරගෙන තිබේ. | බැදීම් හා බැරකම් නිසි පරිදි මුල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දැමීම.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනයේ රු. මිලියන 40 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් යටතේ 2016 වර්ෂයේදී ආරම්භ කර තිබූ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත වියදම රු.මිලියන 26.52 ක් දරා රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සඳහා වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම් (ICT Solution for Gov Analyst Dept- GAD) ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වලින් | 2017 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙනුවෙන් ආරම්භ කරන ලද ICT Solution for Gov Analyst Dept (GAD) ව්‍යාපෘතිය සඳහා රජයේ රසපරීක්ෂක ගේ අනුමැතිය ලබා ගන්නා ලදී. එම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය හා සංවර්ධනය කරන ලද මෘදුකාංග පද්ධතියෙන් සැපයෙන පහසුකම් අතර වෙනස්කම් හඳුනා ගන්නා ලද අතර, ඒ අනුව සිදුකල විචලතාව අධ්‍යනයකදී හඳුනා ගන්නා ලද විචලතාවයන් | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති තෝරාගෙන එම ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය |

| | |
|---|---|
| සියයට 75ක් පමණ නිමකල පසු එලෙස නිර්මාණය කරන ලද පද්ධතියේ අයිතමයන් හා ආයතනයේ අවශ්‍යතා අතර වෙනස්කම් පැවති බවට අනාවරණය වීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අතරමග අත්හිටුවා තිබුණි. | සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටී. මෙම මෘදුකාංග සංවර්ධන කාර්යය අධීක්ෂණය කිරීම සඳහා 2023 මාර්තු 27 වන දින පැවති රැස්වීමේදි මේ දක්වා සංවර්ධනය කරන ලද මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කර ක්‍රියාවේ යෙදවීමට තිරණය කරන ලදී. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාක්ෂණ අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා වර්ග අඩි 7,512 ක ඉඩ ප්‍රමාණයක් මාසිකව රු.1,878,000 ක් ගෙවීමේ පදනම මත 2021 ජුනි සිට අවුරුදු 05 ක බදුකුලී ගිවිසුමක්, පෞද්ගලික සමාගමක් සමඟ ඇති කර ගෙන තිබුණි. ඉන් වර්ග අඩි 2,217 ක් ඌන උපයෝජිතව පවතින නිසා 2022 ජුලි මාසයේදී අදාල ආයතනයට ආපසු භාරදී තිබුණි. එම කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද රු.6,651,000ක මුදල නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය සඳහා අවම කාර්ය මණ්ඩලයක් ස්ථාපිත වීමෙන් පසුව අමාත්‍යාංශය ඉඩ පහසුකම්වලින් තොරව ICTA ආයතනයේ එක් කාමරයක් තුල නිසි පහසුකමක් නොමැතිව රාජකාරි කටයුතු කරගෙන යන ලදී. 2021 ජූනි 30 දින වන විට ICTA ආයතනය වෙනත් ගොඩනැගිල්ලකට රැගෙන යා යුතු බැවින් එදිනට ප්‍රථම අමාත්‍යාංශය වන් ගොල් ෆේස් වෙත රැගෙන යාමට සිදු විය.<br>2022 ජූලි මස වන විට තාක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක නොවන තත්වයක්ද, අමාත්‍යාංශය යටතේ ආරම්භකර ස්ථාපිත කිරීමේ මූලික කටයුතු කරමින් පැවති සි/ස ටෙක්නෝ පාර්ක් ඩිවර්ලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් සමාගමේ කටයුතුද, සැලසුම්කළ පරිදි ඉදිරියට කරගෙනයාම පිළිබඳ ගැටළු පැනනැගි තිබුණි. වන් ගෝල් ෆේස් ගොඩනැගිල්ලේ කාර්යාල ඉඩකඩ කුලියට ගැනීම සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය විසින් විගණන විමසුම් ඉදිරිපත් වීමත්, හේතුවෙන් හැකිතාක් අවම ඉඩකඩක් තුල කටයුතු සංවිධානය කර ගැනීම සම්බන්ධයෙන්ද අවධානය යොමු | රටේ ආර්ථිකයට ගැලපෙන ලෙස අවම පිරිවැයක් වැයවන පරිදි අමාත්‍යාංශය සඳහා ගොඩනැගිලි තෝරා ගත යුතු අතර සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරන ලදී. පවතින මූල්‍ය තත්වය හේතුවෙන් කාර්යාල ඉඩකඩ උපරිම ලෙස කළමනාකරණය කරලීමේ අවශ්‍යතාවය හා ඒ සඳහා යන පිරිවැය සලකා මෙම තිරණය ගෙන ඇති බව වැඩි දුරටත් දන්වමි. | |
| (ආ) | අරමුණු 09ක් ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය (Centre of Excellence in Robotic Applications) පිහිටුවීම සඳහා එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් රු.189,909,295 වැයකර ඉදිකිරීම් කටයුතු හා උපකරණ මිලදී ගැනීම් සිදුකර තිබුණද එම අරමුණු 09 ඉටුකරගෙන නොතිබුණි. | මෙම මධ්‍යස්ථානය 2014 සිට මේ දක්වා අමාත්‍යාංශ කිහිපයක් යටතේ සිදු කර තිබේ.ඒ අනුව ඔබ විසින් පෙන්වා දි ඇති පරිදි එහි අරමුණ ඉටු නොවිමට හේතු සෙවීම සඳහා පූළුල් පරීක්ෂණයක් කළ යුතු බැවින් ඒ පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන ඔබ වෙත වාර්තා කිරීමට සටහන් කර ගනිමි. | පවත්නා සම්පත් කාර්යක්ෂමව භාවිතා කර අදාල ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා වර්ග අඩි 3000 ක පමණ ශ්‍රවණාගාර දෙකක් වායුසමීකරන යන්ත්‍ර 10ක් සවිකර කාපට් අතුරා බිම් සැලසුම් (floor plan) සකස් කර තිබුණි. මේ සඳහා 2018 වර්ෂයේදී මිලියන 40 ක් වැය කර ස්ථාපිත කරනු ලැබූ Robert Arm යන්ත්‍ර ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත අභාවිතව පැවතිණි. | ROBOT ARM යන්ත්‍ර උපකරණ ඉදිරියේදී විධිමත්ව ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි කටයුතු කිරීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගනිමි. | පවත්නා සම්පත් කාර්යක්ෂමව භාවිතා කර අදාල ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් යටතේ දේශීය භාණ්ඩ හා සේවා මත බදු ලෙස රු.16,755,636,726 ක් දක්වා ඇත්තේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එකතුකොට භාණ්ඩාගාරය වෙත | ඉදිරියේදී මෙම ආදායම සඳහා මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව වාර්තා අමාත්‍යාංශයට ලබාගෙන අවශ්‍ය නියාමනය කිරීමේ කටයුතු සිදුකිරීමට පියවර ගැනීමට සඳහා උපදෙස් ලබාදීමට කටයුතු කරන ලදී. ඔබ විසින් සඳහන් කර ඇති පරිදි රු.16,755,636,726 සඳහා | මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් කරන ආදායම් පිළිබඳ විස්තර අදාළ ආයතනයෙන් ලබා ගැනීමටත් එම කටයුතු නිසි පරිදි නියාමනය කිරීමටත් පියවර ගත යුතුය. |

ප්‍රේෂණය කරන ලද භාණ්ඩාගාරය විසින් සිගැස් (CIGAS) වැඩසටහනෙහි ඇතුලත් කරන ලද වටිනාකම වන අතර එම ආදායමේ නිවැරදිතාවය තහවුරු කරගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් සිගැස් (CIGAS) වැඩසටහනෙහි ඇතුලත් කල වටිනාකම සහිත ලේඛනය හැර අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබූ අතර එම විස්තර අදාල ආයතනයෙන් ලබා ගැනීම සහ නියාමනය සඳහා අමාත්‍යාංශය හා එම ආයතනය අතර නිසි ක්‍රමවේදයක් ද නිර්මාණය වී නොතිබුණි.

අවශ්‍ය විස්තරාත්මක වාර්තාවක් ගෙන්වා ගෙන අවශ්‍ය පරීක්ෂාවන් සිදුකිරීමට සටහන් කර ගනිමි.